# අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

**10/11 ශ්‍රේණි සඳහා වීඩියෝ පාඩම් මාලාවේ ක්‍රියාකාරකමට අදාළ පිළිතුරු**

**10 ශ්‍රේණිය - පරිච්ඡේදය 03 - ව්‍යාපාර සංවිධාන**

**හවුල් ව්‍යාපාර**

.................................................................................................

**01.**

i. හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රමයට

ii. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත

**iii.** <u>වාසි</u>

- පහසුවෙන් ආරම්භ කළ හැකි වීම.
- වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම.
- හවුල්කරුවන් සතු විවිධ දක්ෂතා ප්‍රයෝජනයට ගත හැකි වීම.
- වගකීම හවුල්කරුවන් අතර බෙදී යාම.
- සාමූහික තීරණ ගත හැකි වීම.

<u>අවාසි</u>

- වගකීම අසීමිත වීම.
- ලාභය හවුල්කරුවන් අතර බෙදී යාම.
- හවුල්කරුවන් අතර මතභේද ඇතිවිය හැකි වීම.
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
- නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.

iv. අ). එකඟ විය නොහැකි ය.

ආ). සඳුන් හා නඳුන් යන හවුල්කරුවන් දෙදෙනාගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වා ගෙන යන නිසා ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතු වේ.

**02.**

අ). සත්‍යයි

ආ). අසත්‍යයි

ඉ). අසත්‍යයි

ඊ). සත්‍යයි

උ). සත්‍යයි

**03.**

1. ලාභ ලැබීමේ අරමුණෙන් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන පුද්ගලයන් අතර පවත්නා සම්බන්ධතාව හවුල් ව්‍යාපාරයක් යනුවෙන් හැඳින්වේ.

2. 2007 අංක 07 දරන සමාගම් පනත

3.

- ලිඛිතව
- වාචිකව
- ව්‍යංගයෙන්

4. 1840 වංචා වැළැක්වීමේ ආඥා පනතට අනුව හවුල් ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය රු. 1 000ක් හෝ ඊට වඩා වැඩි නම් ලිඛිත ගිවිසුමක් යටතේ ව්‍යාපාරය පවත්වා ගෙන යා යුතු වන අතර මෙම ලිඛිත ගිවිසුම හවුල් ඔප්පුව යනුවෙන් හැඳින්වේ.

5.

- සාමාජික සංඛ්‍යාව අවමය දෙදෙනෙකු හා උපරිමය 20ක් වීම.
- හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වීම.
- ලියාපදිංචිය අනිවාර්ය නොවීම.
- නීතිමය පුද්ගලභාවයක් නොමැති වීම.
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.

**04.**

1. (2)
2. (1)
3. (3)
4. (3)
5. (4)